# 2.19 අනුරාධපුර යුගයේ ප්‍රාදේශීය පාලන සංවිධාන

ධම්මිකා කුමාරි මනතුංග
ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRAT

අනුරාධපුර රාජධානිය එහි දීර්ඝ ඉතිහාසය තුළ වරින්වර පැනනැගුණු අවශ්‍යතාවලට අනුව හැඩගැසෙමින් දේශපාලන හා පරිපාලනමය වශයෙන් බොහෝ වෙනස්කම්වලට භාජනය වෙමින් වර්ධනය වූවෙකි. මේ වකවානුවේ ඉතිහාසය නොයෙක් පැතිකඩ ඔසසේ විග්‍රහයනට භාජනය වී ඇතත්, දේශපාලන ඉතිහාසයට අදාළව ප්‍රාදේශීය පාලනය පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමුවී නොමැති බව පෙනෙන්නට තිබේ මේ අධ්‍යයනයෙන් මා බලාපොරොත්තුවන්නේ මේ වන තෙක් මේ විෂය ක්ෂේත්‍රය හා සම්බන්ධව ඉදිරිපත් වී ඇති කරුණු ද සැලකිල්ලට ගනිමින් ප්‍රාථමික මූලාශ්‍රය ඇසුරින් අනුරාධපුර යුගය තුළ ප්‍රාදේශීය පාලන සංවිධාන හැඩගැසුනේ කෙසේද කවර අන්දමකට ද යන්න පිළිබඳ පරීක්ෂා කිරීමයි.

අනුරාධපුර යුගය වශයෙන් සැලකිය හැකි වසර 1400ක පමණ වු දීර්ඝ ඉතිහාසය තුළ ප්‍රධාන පරිපාලන ආයතනත්, පළාත්පාලන ආයතනත් බොහෝ වෙනස්වීම්වලට භාජනය වු නමුත් එම වෙනස් වීම් හැම විටම වංසකථා තොරතුරුවල පැහැදිළිව දක්වා නැති එහෙත් අනුරාධපුර යුගයේ විශේෂයෙන් එහි දෙවන භාගයට අයත් ශිලා ලේඛන ගණනාවක් මේ සම්බන්ධ තොරතුරු හෙළිදරව් කර ගැනීමේ දී බෙහෝ දුරට වැදගත්විය.

පොදුවේ මේ අවධියේ පාලන තන්ත්‍රය සම්බන්ධයෙන් සලකා බැලීමේ දී පෙනී යන්නේ වරින් වර පැනනැගුණු අවශ්‍යතාවලට අනුව හැඩගැසෙමින් පාලන තන්ත්‍රය වර්ධනය වු බවයි. එමෙන්ම මධ්‍ය පාලනය හැරුණු විට එමගින් සම්පූර්ණයෙන් ම නිදහස් නො වු ප්‍රාදේශීය පාලන ක්‍රමයක් ද සංවිධානය වී තිබු බවයි. ප්‍රධාන පරිපාලන ඒකක හා උප පරිපාලන ඒකක වශයෙන් මෙම පාලන සංවිධාන කොටස් දෙකක් යටතේ හඳුනාගත හැකිය. එමෙන්ම මෙම පරිපාලන ව්‍යුහය යටතේ ඉහළම පරිපාලන ඒකකයේ සිට කුඩාම පරිපාලන ඒකකය වු ගම දක්වා බලය විමධ්‍යගත වූයේ කෙසේද යන්න විමර්ශනයට ලක් කළ හැකිය.